# තනතුරු ඇබෑර්තු

## පරිසර අමාත්‍යාංශය

### වෙරළ සංරක්ෂණ හා වෙරළ සම්පත් කළමනාකරණ දෙපාර්තමේන්තුවේ ශ්‍රී ලංකා තාක්ෂණ සේවයේ අධි ශ්‍රේණියේ ප්‍රධාන වැඩ පරීක්ෂක තනතුරුවල පුරප්පාඩු පිරවීම - 2025

1. දැනට පුරප්පාඩුව පවතින වෙරළ සංරක්ෂණ හා වෙරළ සම්පත් කළමනාකරණ දෙපාර්තමේන්තුවේ, ශ්‍රී ලංකා තාක්ෂණ සේවයේ අධි ශ්‍රේණියේ ප්‍රධාන වැඩ පරීක්ෂක තනතුරු **02ක්** පිරවීම සඳහා, මෙම නිවේදනයේ සඳහන් අයදුම්පත් භාර ගන්නා අවසන් දිනට, මෙම දෙපාර්තමේන්තුවේ සක්‍රීයව සේවයේ නියුතු ශ්‍රී ලංකා තාක්ෂණ සේවයේ කාර්මික සහකාර (සිවිල්/යාන්ත්‍රික) හෝ සැලසුම් ශිල්පී යන තනතුරක I ශ්‍රේණියේ නිලධාරින්ගෙන් අයදුම්පත් කැඳවනු ලැබේ.

2. සුදුසුකම් :
   - i. ශ්‍රී ලංකා තාක්ෂණ සේවයට අයත් කාර්මික සහකාර (සිවිල්/යාන්ත්‍රික) හෝ සැලසුම් ශිල්පී යන තනතුරක I ශ්‍රේණියේ අවම වශයෙන් වසර 06ක සක්‍රීය හා සතුටුදායක සේවා කාලයක් සම්පූර්ණ කර තිබීම හා නියමිත වැටුප් වර්ධක 06 ම උපයා ගෙන තිබීම.
   - ii. රාජ්‍ය සේවා කොමිෂන් සභා චක්‍රලේඛ 01/2020 හි සඳහන් විධිවිධානයන්ට අනුකූලව විනයානුකූල දඬුවමක් ලබා නොතිබිය යුතුය.
   - iii. අනුමත කාර්යසාධන ඇගයීමේ පටිපාටියට අනුව උසස් කිරීමේ දිනට පෙරාතුව වූ වසර 06ක් තුළ සතුටුදායක මට්ටමේ හෝ ඊට ඉහළ කාර්යසාධනයක් පෙන්නුම් කර තිබීම.
   - iv. තෙවන කාර්යක්ෂමතා කඩඉම් පරීක්ෂණය සමත් වී තිබීම. (අංක 1930/12 හා 2015.09.01 දිනැති ශ්‍රී ලංකා තාක්ෂණ සේවා ව්‍යවස්ථාව අනුව එම සේවා ව්‍යවස්ථාව ක්‍රියාත්මක වන දිනය වනවිට ශ්‍රී ලංකා තාක්ෂණ සේවයේ I ශ්‍රේණියට උසස් වී වසර 5ක් සම්පූර්ණ කර ඇති නිලධරයන් III කාර්යක්ෂමතා කඩඉම් පරීක්ෂණය සමත් වීමේ අවශ්‍යතාවයෙන් නිදහස් කරනු ලැබේ.)
   - v. තනතුරට බඳවා ගැනීම සඳහා අවශ්‍ය සියලුම සුදුසුකම් අයදුම්පත් භාරගන්නා අවසන් දිනට සෑම ආකාරයකින් ම සම්පූර්ණ කර තිබිය යුතුය.

3. බඳවා ගැනීමේ ක්‍රමය :
   රාජ්‍ය සේවා කොමිෂන් සභාව මඟින් පත් කරනු ලබන පරීක්ෂණ මණ්ඩලයක් විසින් පවත්වනු ලබන සේවා පළපුරුද්ද හා කුසලතාවය සඳහා ලකුණු ලබා දෙන ව්‍යුහගත සම්මුඛ පරීක්ෂණයක ප්‍රතිඵල මත අදාළ සෙසු අවශ්‍යතාවයන් ද සම්පූර්ණ කර ඇති බවට පත්කිරීම් බලධරයා විසින් සුදුසුකම් පරීක්ෂා කර තහවුරු කර ගැනීමෙන් අනතුරුව ව්‍යුහගත සම්මුඛ පරීක්ෂණයේ කුසලතා අනුපිළිවෙල මත සහ පවතින පුරප්පාඩු සංඛ්‍යාව අනුව විශේෂ ශ්‍රේණියට උසස් කිරීම පත්කිරීම් බලධරයා විසින් සිදු කරනු ලබයි.

i. ව්‍යුහගත සම්මුඛ පරීක්ෂණයේ ලකුණු ලබා දීමේ පරිපාටිය

| *අනු අංකය* | *ලකුණු ලබාදීමේ ක්‍රමය* | *උපරිම ලකුණු* |
|---|---|---|
| 01 | සේවා පළපුරුද්ද :<br><br>ජ්‍යෙෂ්ඨතම නිලධාරියා සඳහා උපරිම ලකුණු ප්‍රමාණයක් ලබා දෙනු ලැබේ.<br><br>$$\text{අනෙකුත් නිලධාරින් සඳහා ජ්‍යෙෂ්ඨත්වය} = \frac{\text{ජ්‍යෙෂ්ඨතාවය සඳහා වෙන් කර ඇති උපරිම ලකුණු}}{\text{ජ්‍යෙෂ්ඨතම නිලධාරියාගේ අමතර සේවා කාලය (අවුරුදු x12 + මාස)}} \times \text{අදාළ නිලධාරියාගේ අමතර සක්‍රිය හා සතුටුදායක සේවා කාලය (අවුරුදු x12 + මාස)}$$ | 50 |

| අනු අංකය | ලකුණු ලබාදීමේ ක්‍රමය | | උපරිම ලකුණු |
|---|---|---|---|
| 02 | කුසලතාවය :<br>❖ වෘත්තීය සුදුසුකම්<br><br>a) රැකියා ක් ෂේත්‍රයට අදාළ පාඨමාලා<br>● වසර දෙකක ඩිප්ලෝමාව සඳහා ලකුණු 16<br>● වසරක ඩිප්ලෝමාව සඳහා ලකුණු 12<br>● මාස 06කට නොඅඩු සහතික පත්‍ර පාඨමාලාව සඳහා ලකුණු 08<br>● මාස 01කට වැඩි මාස 06ට අඩු සහතික පත්‍ර පාඨමාලාව සඳහා ලකුණු 04<br><br>*උපරිම සුදුසුකම සපුරන ලද පාඨමාලාව සඳහා පමණක් ලකුණු ලබා දීම සිදු කෙරේ. | 16 | 45 |
| | b) දේශීය හෝ විදේශීය ධාරිතා ප්‍රවර්ධන පුහුණු පාඨමාලා/වැඩසටහන් සඳහා<br>● මාස 01 හෝ ඊට වැඩි ලකුණු 05<br>● සති 01 - මාස 01 අතර පුහුණුව ලකුණු 02<br>● සති 01 කට අඩු පුහුණුව ලකුණු 01<br><br>*උපරිම ලකුණු සීමාවට යටත්ව පුහුණු පාඨමාලා/වැඩසටහන් එකකට වැඩි ගණනකට ලකුණු ලබා දේ. | 10 | |
| | ❖ ඉංග්‍රීසි පාඨමාලා<br>● මාස 06කට නොඅඩු ඩිප්ලෝමා පාඨමාලා ලකුණු 06<br>● මාස 06ට අඩු මාස 03ට වැඩි සහතිකපත්‍ර පාඨමාලා ලකුණු 03<br><br>*උපරිම සුදුසුකම සපුරන ලද පාඨමාලාව සඳහා පමණක් ලකුණු ලබාදීම සිදු කෙරේ. | 06 | |
| | ❖ පරිගණක/තොරතුරු පාඨමාලා<br>● මාස 06කට නොඅඩු ඩිප්ලෝමා පාඨමාලාව ලකුණු 09<br>● මාස 06ට අඩු මාස 03ට වැඩි සහතික පත්‍ර පාඨමාලාව ලකුණු 06<br>● ශ්‍රී ලංකා පරිගණක මෙහෙයුම් බලපත්‍රය දැරීම ලකුණු 03<br><br>*උපරිම සුදුසුකම සපුරන ලද පාඨමාලාව සඳහා පමණක් ලකුණු ලබාදීම සිදු කෙරේ. | 09 | |
| | ❖ රැකියා ක් ෂේත්‍රයට අදාළ ආයතනගතව ලබා ගෙන ඇති ප්‍රසංශා ලිපි<br>● පොදු 230බී ආකෘතිය අනුව ප්‍රසංශා ලිපි ලකුණු 02 බැගින්<br>● තම දෙපාර්තමේන්තු ප්‍රධානීන් මඟින් ලබා ගෙන ඇති ප්‍රසංශා ලිපි ලකුණු 01 බැගින් | 04 | |
| 03 | ❖ සම්මුඛ පරීක්ෂණය<br>● පෞරුෂත්වය ලකුණු 02<br>● නායකත්වය ලකුණු 02<br>● සන්නිවේදන හැකියාව ලකුණු 01 | | 05 |
| | එකතුව | | 100 |

*සැ. යු.*- සහතික පත්‍ර හා ලියවිලි මඟින් සම්මුඛ පරීක්ෂණයේ දී සනාථ කරනු ලබන සුදුසුකම් සඳහා පමණක් ලකුණු ලබා දෙනු ලැබේ. සියළු පාඨමාලා රජය විසින් පිළිගත්/අනුමත ආයතනයක් මඟින් පැවැත්වූ පාඨමාලා විය යුතුය.

ii. ශ්‍රී ලංකා තාක්ෂණ සේවයේ අධි ශ්‍රේණියට උසස් කිරීම මත අදාළ තනතුරට පත් කිරීම සිදු කෙරෙන අතර, උසස්වීමේ දිනය සම්මුඛ පරීක්ෂණ දිනය වේ. මෙම තනතුරට පත් කරනු ලබන දිනය තනතුරේ වැඩ භාර ගන්නා දිනය වේ.

4. මෙම තනතුර සඳහා අදාළ වැටුප් ක්‍රමය :
රා.පරි.ච. 03/2016 අනුව MN 7-2016 වැටුප් කාණ්ඩයේ, මාසික වැටුප් පරිමාණය රු. 41,580 11x755-18x1,030 = 68,425 කි.

5. අයදුම්පත් යොමු කිරීම
පහත සඳහන් ආදර්ශ අයදුම්පතට අනුව සකස් කරන ලද අයදුම්පත්, අයදුම්පත් කැඳවීමේ අවසන් දිනය වන **2025.01.31** දිනට හෝ ඊට පෙර අයදුම්කරුවන් විසින් තම, අංශ ප්‍රධානී මඟින් අධ්‍යක්ෂ ජනරාල්, වෙරළ සංරක්ෂණ හා වෙරළ සම්පත් කළමනාකරණ

දෙපාර්තමේන්තුව, තැ. පෙ. 556, නව මහලේකම් කාර්යාලය, මාලිගාවත්ත, කොළඹ 10 යන ලිපිනයට ලියාපදිංචි තැපෑලෙන් හෝ අතින් ගෙනවිත් භාර දිය යුතුයි. කවරයේ වම්පස උඩ කෙලවරේ ''වෙරළ සංරක්ෂණ හා වෙරළ සම්පත් කළමනාකරණ දෙපාර්තමේන්තුවේ ශ්‍රී ලංකා තාක්ෂණ සේවයේ අධි ශ්‍රේණියේ ප්‍රධාන වැඩ පරීක්ෂක තනතුරුවල පුරප්පාඩු පිරවීම සඳහා වන සම්මුඛ පරීක්ෂණය'' යනුවෙන් පැහැදිලිව සටහන් කළ යුතුයි.

රාජ්‍ය සේවා කොමිෂන් සභාවේ නියෝගය පරිදි

ලේකම්,
පරිසර අමාත්‍යාංශය.